**<u>පළමුවන කියවීම</u>** යෙසායා 49 : 3, 5-6

යෙසායා දිවැස්ප්‍රසාදි තුමන්ගේ පොතෙන් ගත් පාඨයකි.

**මාගේ ගැළවීම ලොව පුරා පැතිරෙන පිණිස මම ඔබ ජාතීන් හට ආලෝකයක් කරමි.**

සමිඳාණෝ කතා කොට ඉශ්‍රායෙල්, නුඹ මාගේ සේවකයාය. නුඹ මගින් සෙනග මාගේ මහිමය ප්‍රකාශ කරනු ඇතැ'යි වදාළ සේක.

මා උපදින්නටත් පෙර තමන්ගේ සෙනග ආපසු ගෙනෙන පිණිස විසිර සිටින ඉශ්‍රායෙල් ජනයා ජාකොබ්ගේ වංශය එක් රැස් කරන පිණිසත් සේවකයෙකු වශයෙන් සමිඳාණෝ මා පත් කළ සේක. සමිඳාණෝ මට ගෞරවය දෙන සේක. එතුමාණෝ මාගේ ශක්තිය වන සේක.

එතුමාණෝ මට මෙසේ වදාළ සේක. ''ඉතිරිව සිටින ඉශ්‍රායෙල්වරුන් එනම්, ජාකොබ්ගේ වංශයේ ජනයා නැගිටුවා පුනරුත්ථාපනය කිරීමට මාගේ සේවකයා ලෙස ඔබ පත් කිරීම සුළුපටු දෙයක් නොවනු ඇත. එනම්, මුළු ලොව ගළවනු පිණිස සියලු ජාතීන් හට නුඹ ආලෝකයක් වන්න මම සලස්වන්නෙමි.

දේව වාක්‍ය එසේය.

**<u>පිළිතුරු ගීය</u>** ගීතාවලිය 40 : 1, 3, 6-9

පිළිතුර : මාගේ දෙවියනී ඔබේ කැමැත්තට මම ප්‍රිය වෙමි.

ගීය : මම ඉවසිල්ලෙන් හිමිතුමන් ගැන බලාපොරොත්තුවෙන් සිටියෙමි. හිමිතුමාණෝ මාගේ දුක් ගැනවිලි වලට සවන් දුන් සේක.

තදවිදුන් හට තුති පවසන නව ගීයක් මා මුවේ තැබූ සේක. මෙය දැන බොහෝ දෙනකු ගරු බියෙන් ඇලළී සමිඳුන් කෙරේ අදහනු ඇත.

ඔබ පුද පඬුරට ප්‍රසන්න නැත. දවන යාග පූජා හා පාප පූජාවලින් ඔබට වැඩක් නැත. ඒ වෙනුවට ඔබ වදන් අසන පිණිස මාගේ දෙසවන දුන් සේක. එවිට මම, ''මෙහිය'යි කීවෙමි. මා පිළිබඳ අණ පණත් ඔබේ ව්‍යවස්ථාවෙහි ලියා ඇත.

මාගේ දෙවියනී, ඔබේ කැමැත්තට මම ප්‍රිය වෙමි. ඔබේ නිති ම'සිතෙහි නිදනි තර ගතිමි. සමිඳුනී ඔබට වඳින පිරිස් මැද, ඔබේ ගැළවීමේ ක්‍රියා වර්ණනා කළෙමි. නොනවත්වා එය තවත් වර්ණනා කරන බව ඔබ දන්නා සේක.

**<u>දෙවන කියවීම</u>** 1 කොරින්ති 1 : 1-3

ශුද්ධවූ පාවුළු තුමන් විසින් කොරින්තිවරුන්ට ලියන ලද පළමුවන හසුනෙන් කොටසකි.

**වරප්‍රසාදය හා සාමය ඔබට ලැබේවා!**

ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ අපෝස්තුළුවරයෙකු වීමට දේව කැමැත්ත අනුව කැඳවීම ලත් පාවුළු හා අප සොහොයුරු සොස්තනීස්ගෙන් කොරින්තියේ පිහිටා ඇති දෙවියන් වහන්සේගේ සභාව වෙතටය. එනම්, ඒ සභාවේ ක්‍රිස්තුස් වහන්සේට කැපවූ දෙවියන් වහන්සේගේ සෙනග වීමට කැඳවීම ලත් අයද ඔවුන්ගේත් අපගේත් ස්වාමින් වන ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ ගේ නාමයෙන් සෑම තැන්හි අයැදුම් කරන සියල්ලන්ද වෙතටය. අපගේ පියාණන් වන දෙවියන් වහන්සේගෙන්ද ස්වාමින් වන ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගෙන්ද කරුණාවත් ශාන්තියත් ඔබට වේවා!

දේව වාක්‍ය එසේය.

**සාධුකාරය** මතෙව් 11 : 25

ආලේලූයියා ! ආලේලූයියා !
ස්වර්ගයටත් පොළොවටත් ස්වාමින් වන පියාණන් වහන්ස,
ඔබ වහන්සේ මේ කරුණු පැණවතුන් හා නැණවතුන්
තකරෙන් ආවරණය කොට බාලයන්ට අනාවරණය
බළ හෙයින් ඔබ වහන්සේට තුති පුදමි.
ආලේලූයියා !

**සුවිශේෂය** ජුවාම් 1 : 29-34

සුවිශේෂක ජුවාම් තුමන් විසින් ලියන ලද දේව වාක්‍ය මෙසේය.

**ලොවේ පව් දුරලන අජබාලකයාණෝ**

පසුදින ජුවාම් තෙමේ ජේසුස් වහන්සේ තමා සමීපයට වඩිනු දැක 'මෙන්න ලෝකයේ පාපය දුරලන දෙවියන් වහන්සේගේ බැටළු පෝතකයාණෝ ! මට පසුව එන තැනැන් වහන්සේ මට පෙර සිටි බැවින් මට වඩා උතුම් යයි යමෙකු ගැන මම කීවෙම්ද? ඒ මුන් වහන්සේය. මම උන්වහන්සේ නොහැඳින සිටියෙමි. එහෙත් වතුරෙන් බෞතීස්ම ස්නාපනය කරමින් මා පැමිණියේ උන්වහන්සේ ඉශ්‍රායෙල්වරුන්ට ප්‍රකාශ වන පිණිස ය'යි කීය.

තවද ජුවාම් සාක්ෂි දරමින් 'ආත්මයාණන් පරෙවියෙකු මෙන් අහසින් බැස උන්වහන්සේ වෙත වැඩ හිඳිනු මම දිටිමි. මම උන්වහනසේ නොහැඳින සිටියෙමි. එහෙත් වතුරෙන් බෞතීස්ම ස්නාපනය කරන්නට මා එවා වදාළ තැනැන්වහන්සේම මට කතා කොට 'ආත්මයාණන් යමෙකු පිට බැසවිත් වැඩ හිඳිනු ඔබ දකින්නෙහිද? ඒ වනාහි ශුද්ධාත්මයාණන්ගෙන් බෞතීස්ම ස්නාපනය කරන තැනැන්වහන්සේ ය'යි වදාළ සේක. ඒ දේ මම ම දිටිමි. දැක උන්වහන්සේ දෙවියන් වහන්සේගේ පුත්‍රයාණෝ යයි සාක්ෂි දැරුවෙමි යි කීවේය.

සුවිශේෂ වාක්‍ය එසේය.